**තණමල්විල ප්‍රාදේශීය සභාව - 2021**
**--------------------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

තණමල්විල ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූමූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහපොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේමූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවතණමල්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------ | -------------------------- | ---------------- |
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී තොග අගය කිරීම, ආදායම් හඳුනා ගැනීම සහ කෙරීගෙන යන වැඩ අගය කිරීමේ ගිණුම්කරන ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී තොග අගය කිරීම, ආදායම් හඳුනාගැනීම සහ කෙරීගෙන යන වැඩ ගිණුම්ගත කරන ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි වැඩි දියුණු කිරීමේ සහ නව ගොඩනැගිලි ඉදිකිරීමේ වියදම රු. 2,603,676 ක් ඉඩම් | අදාල වටිනාකම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සටහන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගොඩනැගිලි වැඩි දියුණු කිරීමේ වියදම් ඉඩම් සහ ගොඩනැගිලි සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකය යන ගිණුම්වලට එකතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හා ගොඩනැගිලි ගිණුමේ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකය යන ගිණුම්වල දක්වා නොතිබුණි. | | |
| (ඇ) | ඉකුත් වර්ෂවලදී මිල දී ගෙන තිබුණු, ප්‍රාදේශීය සභාව වර්තමානයේ ප්‍රයෝජනයට ගන්නා රු. 2,154,642 ක් වූ උපකරණ 15 ක වටිනාකම ප්‍රාග්ධනිත නොකිරීම නිසා දේපල පිරියත හා උපකරණ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායම් දායකය යන ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සිදුව ඇති ප්‍රාග්ධන වියදමේ වෙනස නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රාදේශීය සභාව ප්‍රයෝජනයට ගන්නා දේපල පිරියත උපකරණ ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිභෝජන ද්‍රව්‍ය තොගය රු. 253,572 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීමෙන් තොගය හා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදි තොගය ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | රු. 4,612,863 ක වටිනාකම සහිත පුස්තකාල පොත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට විනාශ වී තිබුණද ඒවා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් කර තිබීමෙන් දේපල පිරියත හා උපකරණ යටතේ එම වටිනාකමට ව්‍යාජ වත්කමක් ඇතුළත් බව නිරීක්ෂණය විය. | විධිමත් අනුමැතියක් යටතේ පොත්වල වටිනාකමරු. 4,612,863ක් කපා හැරීමට කටයුතු කරන බවත්, 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ වරද නිවැරදි කිරීමට කටයුතු කරන බවත්දන්වා ඇත. | විනාශ වූ පුස්තකාල පොත්වල වටිනාකම විධිමත්ව ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයට අදාලව එකතුව රු. 1,083,100 ක් වූ ඉදිකිරීම් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබීමෙන් එම ප්‍රමාණයෙන් දේපල පිරියත හා උපකරණ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකය අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දීරු. 1,083,100ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන අතර, නැවත මෙවැනි වැරදි ඇති නොවීමට වග බලා ගන්නා බව දන්වා ඇත. | සභාවට අයත් සියලුම ගොඩනැගිලි දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (උ) ඉකුත් වර්ෂයේ වැරදීමකින් කපා හැර තිබූ රු. 503,915 ක ණයගැති ශේෂය සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කර නොතිබීමෙන් ණයගැති හා සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ වරද නිවැරදි කිරීමට කටයුතු කරන අතර, නැවත මෙවැනි වැරදි ඇති නොවීමට වග බලා ගන්නා බව දන්වා ඇත. | විධිමත් අනුමැතියකින් තොරව අයවිය යුතු ශේෂ කපා හැරීම නොකළ යුතුය. |
| (ඌ) රු. 3,217,154 කින් හිඟ හිටි ආදායම් වැඩියෙන් ගිණුම්ගතකර තිබීමෙන් අතිරික්තය හා ලැබිය යුතු ආදායම් වැඩියෙන් දක්වා තිබුණි. | 2020, 2021 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන පරීක්ෂාකර බලා 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සත්‍ය හිඟය ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (එ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විවිධ තැන්පත් ශේෂය රු. 7,107,781 කින් වැඩියෙන් දක්වා තිබුණි. | තැම්පත් ලේඛනය සමඟ සසඳා බලා2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ නිවැරදි කිරීම සිදුකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදි තැන්පත් ශේෂ ගිණුම්වල දැක්විය යුතුය. |
| (ඒ) ඉකුත් වර්ෂයේ හිඟ උසාවි දඩ සහ මුද්දර ගාස්තු සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා උසාවි දඩ ආදායම් රු. 1,722,101 ක් සහ මුද්දර ගාස්තු ආදායම් රු. 50,149 කින් වැඩියෙන් දක්වා තිබීමෙන් අතිරික්තය හා හිඟ ආදායම් එම ප්‍රමාණවලින් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රවර්ථන ලැබීමක් ලෙස සටහන් කර ඇති රු.1,692,686.05ක හිඟ ලැබීම 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අයවිය යුතු නිවැරදි උසාවි දඩ හා මුද්දර ගාස්තු ගිණුම්වල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඔ) | ප්‍රාග්ධන වියදම් යටතේ දැක්වෙන භෞතික සේවා සහ ප්‍රාදේශීය සංවර්ධන සහයක ව්‍යාපෘති වියදම් ලෙජරය අනුව පිළිවෙලින් රු. 40,066,460 ක් සහ රු. 10,766,156 ක් වූ නමුත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ එය පිළිවෙලින් රු. 36,018,299 ක් සහ රු. 9,860,032 ක් ලෙස ඇතුළත් කිරීම නිසා ප්‍රාග්ධන වියදම රු. 5,154,285 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,094,688 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූආදායම රු.36,177,394 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඩංඩුම සතිපොළ අසල අංක 7 සිට 12 දක්වා කඩ කාමර සඳහා හිඟ ටෙන්ඩර් මුදල් රු. 4,766,900 ක් අයකර ගෙන නොතිබුණි. | කඩිනමින් කඩකාමර ඉදිකිරීම් කටයුතු අවසන් කර ගිවිසුම් ගත විමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | හිඟ ටෙන්ඩර් මුදල් අයකරගත යුතුය. |
| (ආ) | 2020 සහ 2021 වර්ෂවල සමීක්ෂණවලින් හඳුනා ගත් දැන්වීම් පුවරු 111 ක් සඳහා අයවිය යුතු රු. 655,420 ක් අයකරගෙන නොතිබුණි. | ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකර ගැනීම සඳහා අදාළ ආයතන වෙත සිහි කැඳවීම් ලිපි යවා ඇත. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

**කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>සභාව විසින් ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයක බොරළු යොදා ඉදිකර තිබුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘති 12 කට අදාලව ප්‍රවාහන විෂයය සඳහා ගෙවීම් කිරීමේදී, බොරළු ඝන මීටර් 200 ට අඩු කර්මාන්තවලට අදාල අනුපාත යොදාගෙන ගෙවීම් කිරීම නිසා, රු.1,404,751 ක් වැඩිපුර ගෙවා තිබුණි.</td><td>සංවර්ධනය කිරිමේදි වැඩිපුර ගෙවා තිබු කර්මාන්ත සම්බන්ධව මෙම ප්‍රාදේශීය සභාවේ හිටපු කාර්මික නිලධාරීට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර විධිමත් විනය පරීක්ෂණයක් මේ වන විට පැවැත්වෙන බව දන්වා ඇත.</td><td>සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකරගත යුතුය</td></tr>
<tr><td>(ආ)</td><td>සභාව විසින් ඉටුකර තිබුණු මාර්ග කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘති 3 ක ප්‍රමාණ පත්‍රය හා නිම්වැඩ වාර්තාව අනුව මාර්ගයේ උස අඟල් 6 ක් විය යුතු වුවද, විගණන නිලධාරීන් විසින් මාර්ගය භෞතික පරීක්ෂාවේදී එහි උසඅඟල් 5ක් වූ බැවින් එකතුව රු. 407,494 ක මුදලක් වැඩිපුර ගෙවා තිබු අතරම මාර්ගය අපේක්ෂිත තත්ත්වයෙන් ඉදිකර නොමැති බවද නිරීක්ෂණය විය.</td><td rowspan="2">මේ පිළිබඳ පරීක්ෂා කර බලා අදාළ නිලධාරීන්ගෙන් වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත.</td><td rowspan="2">සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකරගත යුතුය.</td></tr>
<tr><td>(ඇ)</td><td>ඉකුත් වර්ෂයේ වැඩ අවසන්කර තිබුණු සඳගලගම ප්‍රජාශාලාවේ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට දින 406 ක් ප්‍රමාදවී තිබුණද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමේදී රු.154,299 ක් අඩුවෙන් අයකර තිබුණි.</td></tr>
</table>